# දැන්වීමයි

විශ්වවිද්‍යාල විද්‍යායතන වල 2017 ශිෂ්‍ය කණ්ඩායම සඳහා උසස් ජාතික ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2022 අප්‍රේල් මස 20 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

2022 පෙබරවාරි 28 වන දින වන විට සම්පූර්ණ පාඨමාලාව සාර්ථකව නිම කර ඇති ශිෂ්‍ය කණ්ඩායම් මෙම උසස් ජාතික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා සුදුසුකම් ලබයි. සම්පූර්ණ පාඨමාලාව සාර්ථකව නිම කිරීම යනුවෙන් අදහස් කරනුයේ සියළුම විභාග සහ රැකියාගත පුහුණුව සාර්ථකව නිම කිරීමයි.

එලෙස පාඨමාලාව සම්පූර්ණ කරන තෙක් ශිෂ්‍යයන් ඩිප්ලෝමා ප්‍රධාන උත්සවයට යොමු නොකළ යුතු බවට මෑතකදී සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතන හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය එකතුව තීරණය කොට ඇත.

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 ශිෂ්‍ය කණ්ඩායමේ රැකියාගත පුහුණුව 2021 දෙසැම්බර් 01 දින සිට 2022 මැයි 22 දින දක්වා පැවැත්වේ. අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අධ්‍යයන දින දර්ශනයට අනුව 2017 ශිෂ්‍ය කණ්ඩායමේ රැකියාගත පුහුණුව නිමා වනුයේ 2022 මැයි 22 දින වන අතර එම පුහුණුව අවසානයේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) මඟින් පවත්වන වාචික සම්මුඛ පරීක්ෂණ (Viva Voce) වලින්ද සමත් විය යුතුය.

මේ අනුව මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 ශිෂ්‍ය කණ්ඩායම මේ වන විටත් රැකියාගත පුහුණුව සම්පූර්ණ කර නොමැති බැවින් මෙම උසස් ජාතික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා සුදුසුකම් නොලබන අතර 2015 හා 2016 ශිෂ්‍ය කණ්ඩායම් වල පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇති පුනර් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් මේ සඳහා සුදුසුකම් ලබා ඇත.

අධ්‍යාන දින දර්ශන නිසි පරිදි සකසා ඒ සඳහා අධ්‍යාන මණ්ඩල අනුමැතිය පවා ලැබී තිබුණද මාතර විශ්වවිද්‍යාල විද්‍යායතන ශිෂ්‍යයින් පහත දැක්වෙන ආකාරයට පංති වර්ජනයේ නියැලීම නිසා අනුමත කර ගත් පරිදි අධ්‍යාන පාඨමාලාව සම්පූර්ණ කල නොහැකි විය. එසේ නොවන්නට අදාළ සිසුන් පහසුවෙන්ම මෙවර ඩිප්ලෝමා ප්‍රධානොත්සවයට සහභාගී කල හැකිව තිබුණි.

2017 අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා මාස දෙකක් පමණ (සිසුන් හතර දෙනෙකුගේ පංති තහනම් කිරීම සම්බන්ධයෙන්)

2019 ජනවාරි සිට පෙබරවාරි දක්වා මාසයක් පමණ - (විශ්වවිද්‍යාල විද්‍යායතනය පිටුපස ඇති ආහාර දෙපාර්තමේන්තුව/ වී අලවි මණ්ඩලයට අයත් ඉඩම අත්පත් කර ගැනීමේ අරමුණින්)

2019 නොවැම්බර් මස සති දෙකක් පමණ (2016 ශිෂ්‍ය කණ්ඩායමේ ශිෂ්‍ය පිරිසකට උසස් ජාතික ඩිප්ලෝමා ප්‍රධානොත්සවයට සුදුසුකම් නොලැබීම පදනම් කරගෙන)

2020 ජනවාරි සිට මාර්තු දක්වා මස දෙකක් පමණ (NVQ 7 වැ උපාධි මට්ටම / විශ්වවිද්‍යාල විද්‍යායතන වල පිහිටුවීමේ අභිලාෂයෙන්)

**සහකාර ලේඛකාධිකාරී**

**විශ්වවිද්‍යාල විද්‍යායතනය - මාතර.**